**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය)**
III අදියර - **2014**

-----------------------------------------------------------------------------------------------

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) III අදියර 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා රජය සහ චීනයේ එක්සිම් බැංකුව විසින් සපයනු ලබන අරමුදල් යොදාගනිමින් පිටත වටරවුම් මහාමාර්ගයේ කඩවත සිට කෙළවරපිටිය දක්වා කිලෝමීටර් 9.32 ක මාර්ග කොටස් ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීය. ව්‍යාපෘතිය විසින් සිදුකරන කාර්යයන් මූල්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් චීන එක්සිම් බැංකුව සමඟ 2014 සැප්තැම්බර් 16 දින ණය ගිවිසුමක් අත්සන් කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

-------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අඩු කිරිමට හා රටේ අනෙකුත් ප්‍රදේශවලට සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගයට සහ කොළඹ නගරයෙන් පිටතට යන අනෙකුත් ජාතික මාර්ගවලට සම්බන්ධ කෙරෙන කොළඹ නගරයෙන් බැහැර අධිවේගී මාර්ගයක් ඉදිකිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 75,900 කට සමාන එ.ජ.ඩො මිලියන 583 ක් වූ අතර ඉන් රු.මිලියන 63,356 කට සමාන එ.ජ.ඩො මිලියන 487 මූල්‍යයනය කිරීමට චීන එක්සිම් බැංකුව විසින් එකඟ වී තිබුණි. අදියර III යටතේ මහාමාර්ග ඉදිකිරීම 2014 අප්‍රේල් 1 දින ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු අතර මාස 42 ක් ඇතුළත අවසන් කිරීමට අපේක්ෂිතය. කෙසේ වෙතත් 2013 පෙබරවාරි 22 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර, 2016 ජූලි වන විට අවසන් කිරීමට අපේක්ෂිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු

කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව. සහ

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිටත වටරවුම් මාර්ග අදියර 1 ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ජංගම ගිණුමේ ශේෂය රු.1,980,769,681 ක් වූ අතර පිටත වටරවුම් මාර්ග අදියර III යටතේ පවත්වා ගෙන යන ජංගම ගිණුමේ ශේෂය වූ රු.1,981,295,504 සමඟ එකඟ වී නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ - අදියර 1 ට සිදුරු කිරීමේ සමීක්ෂණ සඳහා ගෙවිය යුතු රු.3,569,788 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර ඇති ස්ථාවර වත්කම් වටිනාකම් තුළ පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතියෙන් මාරුකරන ලද වත්කම් පමණක් නියෝජනය කර තිබුණි.

අනෙකුත් ව්යාපෘති වලින් මාරුකරන ලද අනෙකුත් වත්කම්වල වටිනාකම ලබාගෙන නොතිබුණු අතර ව්‍යාපෘතියේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ණය | 487 | 63,356 | - | - | - | - | - |
| ශ්‍රී.ලං.ර | 96 | 12,544 | 1,374 | 6 | 756 | 34 | 4,407 |
| එකතුව | 583 | 75,900 | 1,374 | 6 | 756 | 34 | 4,407 |

## 3.2 භෞතික ප්‍රගතිය

සිවිල් වැඩ කොන්ත්‍රාත් 2013 පෙබරවාරි 22 ප්‍රදානය කර තිබුණු නමුත් 2014 දෙසැම්බර් 31 වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී විස්තරාත්මක සැලසුම් වැඩ පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ ප්‍රතිපාදන වලට අනුව විදේශාධාර ව්‍යාපෘති යටතේ වූ ගෙවීම් එකතු කළ අගය මත බදු වලින් නිදහස් කර තිබුණත් එකී බදු ඇතුළත් රු.මිලියන 23.76 ක අත්තිකාරම් මුදලක් උපදේශකවරුන්ට ගෙවා තිබුණි.

### 3.4 ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු

-----------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමේ ප්‍රමාදය මත සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 226.62 ක් පොලී වශයෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. තවදුරටත් රු.මිලියන 309.45 ක ප්‍රමාණයක් 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විය.

(ආ) 2007 පෙබරවාරි මාසයේදී ව්‍යාපෘතිය විසින් රු.මිලියන 28 ක පිරිවැයකින් අත්පත් කරගත් වත්තල හීන්කෙන්ද මිල්ලගහවත්ත පිහිටි හෙක්ටයාර් 2.6348 ක ඉඩම අවතැන් වූ පුද්ගලයන් අතර බෙදාහැරීමට පියවර ගැනීමකින් තොරව එදින සිට නිෂ්කාර්යව පැවතුණි. තවද සම්පූර්ණ ඉඩම කොටස් 57 කට මායිම් වෙන්කර තිබූ අතර සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 30.62 ක් වැයකර තිබුණි. කෙසේ වෙතත් මෙම ඉඩම් කැබලි 2014 දෙසැම්බර් 31 දක්වා අවතැන් පුද්ගලයන් සඳහා වෙන්කර නොතිබුණි.

(ඇ) කඩවත ජයසුමන වත්ත නැමැති තවත් ඉඩමක් 2011 දී අදියර III වෙනුවෙන් පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය අදියර II විසින් රු.මිලියන 96 කට අත්පත් කරගෙන තිබුණු අතර රු.මිලියන 4.71 ක මුදලක් ඉඩමේ සංවර්ධන කටයුතු සඳහාද වැයකර තිබුණි. කෙසේ වෙතත් අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) අධිවේගී මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගන්නා ලද ඉඩමක වටිනාකම හානිපූර්ණය කිරිම සඳහා මත්තුමගල කරුණාරත්න බෞද්ධ මහා විද්‍යාලයට අයත් ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීමට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 53.45 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වුවද ඉඩමේ ඔප්පුව, අනුමත ගොඩනැගිලි සැලැස්ම සහ අනෙකුත් අදාළ ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ව්‍යාපෘතිය විසින් අත්පත් කරගන්නා ලද ඉඩමේ පැවති ගොඩනැගිල්ල ව්‍යාපෘතියෙන් වන්දි ලැබීමෙන් පසු මාස 6 ක කාලයක් ඇතුළත කඩාදමා හිස් ඉඩම ව්‍යාපෘතියට භාරදීමට අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එකඟ වී තිබුණද වන්දි ගෙවීමෙන් පසු මාස 20 ක් ඉකුත් වී තිබියදීත් ගොඩනැගිල්ල කඩාදමා නොතිබූ අතර ඉඩම ව්‍යාපෘතියට භාරදීමෙන් තොරව පැවතුණි. තවද, මහල් 4 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වූ ගොඩනැගිලි සැලසුම් පසුව පදනම් රහිතව මහල් 3 කට වෙනස් කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි විධිවිධානවලට පටහැනිව බස්නාහිර පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නම්කරන ලද කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුගෙන් සීමිත මිල ගණන් කැඳවා තිබුණි.

### 3.5 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ සේවක සංඛ්‍යාව 2013 අප්‍රේල් 05 දින සිට බලපැවැත්වෙන පරිදි 2014 අප්‍රේල් 02 දින අනුමත කර තිබුණි. කෙසේ වුවද, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2(1) වගන්තියෙහි දක්වා ඇති බඳවා ගැනීම් පරිපාටියට පටහැනිව මාර්ග සංවර්ධන

අධිකාරියෙන් මුදාහරින ලද සේවක සාමාජිකයන් 26 දෙනෙකුගෙන් 2013 නොවැම්බර් 5 දින සිට අදියර III සඳහා ව්‍යාපෘති නියාමන ඒකකයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි.

(ආ) 2007 අප්‍රේල් 07 දිනැති අංක ඩීඑම්එස් 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව නැවත පදිංචි කිරීමේ දීමනාවට හිමිකම් නොමැති නැවත පදිංචි කිරීමේ සහකාරවරයකුට රු.80,985 ක් වූ දීමනාවක් ගෙවා තිබුණි.

(ඇ) බඳවාගැනීමේ පටිපාටි අනුගමනය කිරීමකින් තොරව දේශීය උපදේශකවරුන් 9 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2.96 ක් වූ පාරිතෝෂික සහ රු.මිලියන 4.57 ක වාහන කුලී ගාස්තු ගෙවා තිබුණි. මෙම උපදේශකයින්ගේ යොමුගත කොන්දේසි වල දැක්වෙන කාර්ය විස්තරය අනුව නිමැවුම මැනිය හැකිවන පරිදි කාර්යභාරය විස්තර නොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස උපදේශකයින්ගේ හිතකර බලපෑම් සහ දායකත්වය විගණනයේදී නිශ්චිතව දැනගත නොහැකි විය.

(ඈ) 2007 අප්‍රේල් 5 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ නියමයන් මත පදනම් නොවී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වාදෙන ලද සූත්‍රයක් පදනම් කරගෙන ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.408,070 ක් වැඩියෙන් වැටුප් ගෙවා තිබුණි.